

# ගුවන් කරණම් ගසන රෝලර්

පුනයා චාන්දනි ද සිල්වා

*හුරැබුහුටි හැඩ රුව ඇති ආකර්ෂණීය ඉන්දියන් රෝලර් (Indian Roller) අපුරුකුරුල්ලෙකි. මෙම හැඩකාරයා හඳුන්වනු ලබන්නේ (Coracias Benghalensis යන විද්‍යාත්මක නමිනි. ගසක උස් අතු මුදුනක හෝ විදුලි කේබල් වයරයක ලගින මෙම කුරුල්ලා ඔබගේ දුරදක්නයට (binoculars) ත්‍රිමාණරූපිව හසුකර ගැනීමට නම් සුනංගු නොවිය යුතු ය. මෙම කුරුලු දර්ශනය මතකයේ සදාකාලික වනු නියතය.*

හිස මුදුන ඔටුන්නක් ලෙස පළඳා සිටින පිහාටු කැටිය නිල් (Powder – blue) පැහැතිය. හොටය යටි ප්‍රදේශය කහ පැහැතිය. ගෙල දෙපස පපු පෙදෙස කහ පැහැති අතර දම් පැහැති වයිරමක් ඒ දිගට පිහිටා ඇත. බඩ වලිග සහ තටු ඉතා දීප්තිමත් වු කොටස දුඹුරු පැහැයෙන් යුක්තය. තද කළු පැහැයෙන් දීප්තිමත් වු දෙනෙත වටා රත්රන් ඉරකි. පියඹන විට විශාලව පෙනෙන පියාපත් චලනය වන්නේ ඉතා සෙමෙන්ය. ඉතා ක්‍රමානුකූල ලෙස මෙම පියාපත් දෙකට බෙදී ඇත. කොකාගේ සුදු ඉගිලෙන විට පෙනෙන්නා සේම (Indian Roller) ඉන්දියන් රෝලර් කුරුල්ලා ගේ පියාපතෙහි ඇති නිල ඉගිළෙන විට ප්‍රදර්ශනය වේ. දෙකට බෙදී ඇති මෙම පියාපතක ඉහළ අර්ධය අහස් නිලෙන් ද පහළ අර්ධය ලා නිල් පැහැයෙන් ද අලංකාරව ඇත. ඉර හොඳින් අහසේ බබලන විට මෙම නිල් වර්ණය turquoise හරිත නිල් පැහැයෙන් දර්ශනය වේ.

ඇතැම් අවස්ථාවලදී ඉන්දියන් රෝලර්" කුරුල්ලා Blue Jay නමින් හඳුන්වනු ලබයි. නමුත් වඩා විශේෂයෙන් අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ Blue Jay කුරුල්ලන් ගේ හැසිරීම් රටාව රෝලර් කුරුල්ලන්ට වඩා වෙනස් වන බවය. Blue Jay කුරුළු විශේෂ තුළ විවිධ කුලයන්ට අයත් විශේෂ වෙති. Jay කුරුල්ලන් ගේ ගහණය මධ්‍ය හිමාලය ප්‍රදේශයට සීමා වී ඇත.

Indian Rollar කුරුල්ලන් ගේ හැසිරීම් රටාව විවෘත ගොවි බිම් සහ මෘදු පතනශීලි deciduous වනාන්තර සඳහා සීමා වී ඇත. ගස් මුදුන්වල තනා ගත් කැදැලිවල ජීවත්වන රෝලර් Rollar බිජු ලන අවස්ථාවට ස්වාභාවික ගස් බෙනයක් තෝරා ගනී. ඉන්දියන් රෝලර් කුරුල්ලන් ආහාර ලෙස කටුස්සන්, ගෙම්බන් සහ විශාල ප්‍රමාණයේ කෘමීන් තෝරා ගනී. පොළව මත සිට ගොදුරු අල්ලා ගත්ත ද දුවිලි, මඩ සහිත බිම් ඇවිදීමට රෝලර් කුරුල්ලා ප්‍රියමනාප නැත.

ලැජ්ජා ශීලී කිරිල්ලියන් තමා නොසලකා සිටීමට ඉඩ ඇති බැවින් ඉතාම ස්නේහවන්ත වු හැසිරීමක යෙදීමට පෙබරවාරි - මාර්තු කාල සීමාවේදි පිරිමි රෝලර් කුරුල්ලන්ට සිදු වේ.ඉන්දියන් රෝලර් කුරල්ලා ගේ ඒක වාචි ශබ්දය ක්රෑ ක් (Kraaackය). නමුත් මෙම ඒක වාචි ශබ්ද රටාව (Monosyllabic) දැන් ගීතවත් ස්වරයක් බවට පරිවර්තනය වී ඇත. එය Kraack-Kraack ක්රෑ ක්රෑ ක් වන අතර ඉගිලීමේ දී ආරෝහණ රටාවන් අනුගමනය කරනු ලබයි.

මේ නිසා ඉගිලෙන අතරම හොටයෙන් ගොදුර ඩැහැ ගැනීම සිරිතය. ශක්තිමත් හොටයෙන් ගොදුර ඩැහැ ගෙන එසැණින්ම යළිත් ඉගිලී ගොස් තමා ලැග සිටි ගස් අත්තේ හෝ වෙනත් අත්තක ලගී. ග්‍රහණයට ගත් ගොදුර පණ පිටින්ම ගිල දැමීමේ ආරවුලක යෙදෙන රෝලර් විටෙක පියඹන කෘමි විශේෂ ගොදුරු කර ගැනීමට තරම් ආක්‍රමණශීලිය.

බාහිර පෙනුමෙන් ස්ත්‍රී පුරුෂ වෙනස හඳුනාගැනීමට නොහැකි තරමටම සමානය. එහෙත් මාර්තු මස වන විට පිරිමි සතුන් ගේ උත්තේජනය ඉහළ ය. ලැජ්ජා ශීලී කිරිල්ලියන් තමා නොසලකා සිටීමට ඉඩ ඇති බැවින් ඉතාම ස්නේහවන්ත වු හැසිරීමක යෙදීමට පෙබරවාරි - මාර්තු කාල සීමාවේදි පිරිමි රෝලර් කුරුල්ලන්ට සිදු වේ.ඉන්දියන් රෝලර් කුරල්ලා ගේ ඒක වාචි ශබ්දය ක්රෑ ක් (Kraaack) ය. නමුත් මෙම ඒක වාචි ශබ්ද රටාව (Monosyllabic) දැන් ගීතවත් ස්වරයක් බවට පරිවර්තනය වී ඇත. එය Kraack - Kraack ක්රෑ ක්රෑ ක් වන අතර ඉගිලීමේ දී ආරෝහණ රටාවන් අනුගමනය කරනු ලබයි.

බොහෝ උදය කාලයට මෙන්ම සන්ධ්‍යාවරුවට රෝලර් කුරුල්ලාගේ උද්යෝගිමත් වු ගුවන් කරණම් දැක ගන්නට ලැබේ. එක් උත්සාහයක් තුළ කරණම් තුන හතරක අතර ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරනු ලබයි. කතුරු ඔන්චිල්ලාවක මෙන් ගසනු ලබන කරණම් නිසාම මෙම කුරුළු විශේෂයRollar යන නමින් හඳුන්වන්නට යෙදුනාවන්නටත් ඇත.



බිත්තර දමන ලද කිරිල්ලිය ඉන් අනතුරුව මෙම සියලු කරණම් නවතා සිය මාතෘත්වය සඳහා සුදානම් වන්නී ය. බිත්තර උණුහුම මඟින් ආරක්ෂා කරයි. පැටවුන්ගේ අයිතියට ඇති දායකත්වය නිසාම පිතෘත්වය වෙනුවෙන් බිත්තර රකින කාලයේ දී ගොදුරු ගෙන ගොස් ඇය ආරක්ෂා කිරීම රෝලර් Rollar කුරුල්ලා සිය වගකීම ලෙස සලකයි. ❐

